ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**

# මාර්ග සංවර්ධන අධිකාරිය

# ලංසු ආරාධනයයි

## මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා සේවා සැපයීම

1. මාර්ග සංවර්ධන අධිකාරියේ **(RDA) කළුතර විධායක ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා** විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ **කළුතර විධායක ඉංජිනේරු කොට්ඨාශය** වෙනුවෙන් පහත සේවා සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

| කොන්ත්‍රාත් අංකය | විස්තරය | කාල සීමාව | ලංසු සුරක්ෂණය | සැපයිය යුතු කම්කරුවන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| RDA/KT/EE/SU/2024/04 | කළුතර විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් කළුතර වැඩ ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනම මත නුපුහුණු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම | මාස 7 යි | රු. 10,000.00 | 15 |
| RDA/KT/EE/SU/2024/05 | කළුතර විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් පානදුර වැඩ ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනම මත නුපුහුණු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම | මාස 7 යි | රු. 10,000.00 | 11 |
| RDA/KT/EE/SU/2024/06 | කළුතර විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් බණ්ඩාරගම වැඩ ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනම මත නුපුහුණු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම | මාස 7 යි | රු. 10,000.00 | 10 |
| RDA/KT/EE/SU/2024/07 | කළුතර විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් නැබඩ වැඩ ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනම මත නුපුහුණු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම | මාස 7 යි | රු. 10,000.00 | 08 |

2. ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය වන්නේ **මාර්ග සංවර්ධන අධිකාරියේ කළුතර විධායක ඉංජිනේරු කාර්යාලයයි.**
3. ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) අනුගමනය කරනු ලැබේ.
4. 2024.05.16 සිට 2024.05.28 දක්වා පෙ.ව. 09.00 සහ ප.ව. 03.00 අතර කාලය තුළ නැවත ගෙවනු නොලබන රු. 1180.00 (වැට් සහිත) අයදුම්පත් ගාස්තුවක් ගෙවා **විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, දකුණු ශ්‍රී සුමංගල පාර, කළුතර උතුර** වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සම්පූර්ණ ලංසු ලේඛන කට්ටල මිලදී ගත හැකිය. ලංසු ලේඛනය මිලදී ගන්නා විට මුල් ගෙවීම් පත්‍රිකාව ඉදිරිපත් විය යුතුය

**2024.05.29 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වේ.** ලංසු භාර ගැනීම අවසන් වූ වහාම විවෘත කෙරෙනු ඇත. ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

5. සෑම ලංසුවක්ම දක්වා ඇති වටිනාකමට පිළිගත් බැංකුවකින් සේවායා නමට ලබාගත් ලංසු සුරක්ෂණයක් (2024.08.29 දක්වා වලංගු) සහිතව ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ රහිතව ඉදිරිපත් වන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ලංසු, කැඳවීමේ අවසන් දිනයේ සිට **දින 63 දක්වා** වලංගු විය යුතුය.

7. කළුතර විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, දකුණු ශ්‍රී සුමංගල පාර, කළුතර උතුර වෙතින් ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

8. මුද්‍රා තබන ලද ලංසු, සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව, විධායක ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, දකුණු ශ්‍රී සුමංගල පාර, කළුතර උතුර වෙත, අවසන් දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදී ලැබීමට සැලස්විය යුතුය. කරුණාකර සෑම ලංසුවකම ඉහල වම් කෙළවරේ **ටෙන්ඩර් අංකය හා ටෙන්ඩරයේ නම** සඳහන් කල යුතුය.

9. වැඩි දුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 034-2229135 ඔස්සේ කාර්යාල වේලාවන්හි දී විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය අමතන්න.

**සභාපති,**
**ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව, විධායක ඉංජිනේරු කාර්යාලය**
**මාර්ග සංවර්ධන අධිකාරිය - කළුතර**